## ජනවාර්ගික යුද්ධය හා රසායණික අවි

වාර්ගික යුද්ධය හා රසායණික අවි නමින් මෙම දේශනය යෝජනා වී තිබුනත් මා හිතන හැටියට නම් ලංකාවේ වාර්ගික යුද්ධයේ නියම තරම දැන ගන්නට නම් රසායණික අවිගැන තාක්ෂණික දැනුමක් ලබාගැනීමෙන් පමණක් කළ නොහැකියි. රසායණික අවි ගැන තාක්ෂණික දැනුමක් ලබා ගන්න එක නරක නැහැ. නමුත් වඩාත් වැදගත් කාරණය ඒක නොවෙයි. රසායණික අවි මෙ වැනි යුද්ධයක් සඳහා භාවිතා කරන්නේ මන්ද? යන්න සොයා බැලීමයි වැදගත් කාරණය. රසායණික අවි හා යුද්ධ අතර ඇති සම්බන්ධතාවය සොයාබැලීමයි

රසායණික ආයුධ මෑත කාලයේ දී ඉරාන-ඉරාක යුද්ධයේදීත් එම රටවල් දෙකම කුර්දි ජනවර්ගයට එරෙහිව කළ සංහාරක යද්ධයේදීත් භාවිතා කර තිබෙනවා. ඊට දශකයකට දෙකකට පෙර වියට්නාමයට එරෙහිව ඇමෙරිකාව කළ යුද්ධයේ දී රසායණික අවි වර්ගයක් භාවිතා කර තිබෙනවා. එය නාපාම් නමින් හැඳින්වුණු ප්‍රාථමික වර්ගයක්. එය ලංකාවේදීත් ගුවන් හමුදාව විසින් 1987-90 දී තරම ජෙනරල් කොබ්බෑකඩුව ගේ පාලනය යටතේ භාවිතාකර තිබෙනවා. ඒ කාලයේ ඇසිඩ් වර්ගත් ප්‍රහාර වලට භාවිතා කොට තිබෙනවා. ඒවාට යාපනයේ පාසල් සිසුන් ගොදුරු වූ බවට වාර්තා තිබෙනවා. මේ හැරුණුවිට රසායණික වායූන් හෙවත් ගෑස් වර්ග භාවිතයක් ද ලෝකයේ තිබෙනවා. රුසියානු බලධාරීන් චෙච්නියානු ගරිල්ලා කණ්ඩායමක ග්‍රහණයෙන් සිවිල් වැසියන් සමූහයක් මුදාගැනීමටත් හරි හැටි නිසි විස්තරයක් නැති ගෑස් වර්ගයක් යොදාගත් බව පසුගිය කාලයේ හෙලිවුණා. එය අධි විෂ 4 -නයිට්‍රෝනයිලින් 99 අඩංගු ගෑස් වර්ගයක් බව ආරංචි පැතිර ඇතත් හරියටම දත්ත තොරතුරු අප සතුව නැහැ. දෙවන ලෝක යද්ධයේදී  නාසි හමුදා බලධාරීන් විසින් විශේෂයෙන් ම ජෙනරල් අයික්මාන් යටතේ රසායණික ගෑස් වර්ග යුදෙව් ජන සංහාරයේදී යොදා ගත් බව කවුරුත් දන්නා දෙයක්. එය කාබන් මොනොක්සයිඩ් නම් හුස්ම හිර කරන ප්‍රාථමික ගෑස් වර්ගයක්. දරුණු රසායණික අවියක් හැටියට අතීතයක් තියෙන්නේ ඇන්තරැක්ස් බැක්ටීරියා වලටයි. එයට දිගු කාලීන පැවත්මක් තිබෙනවා. ශාක සත්ත්ව දේහ තුළට ඇතුළු වී දශක ගණනක් පවතින්නට එයට පුලුවන්. මේ හැරුණු විට ජීව අවි එනම්, වෛරස වර්ග දිලීර වර්ග අවි හැටියට භාවිතා වෙනවා. ඒවායින් වසංගත ඇති කළ හැකියි. ජීව ජාල බිඳ දැමීමෙන් විශාල ව්‍යසන ඇතිකළ හැකියි. ජාන විකෘති ඇතිකළ හැකියි. මා මෙහිදී කිව යුතුයි රසායණික අවි භාවිතා කළ අය ඒවා භාවිතා කරන්නේ තමන්ට අයිතියක් නැති භූමි වලටයි. කොහොමත් රසායණික අවි ආයුධ පිලිබඳ නියම දත්ත තොරතුරු සොයාගැනීම අපහසුයි. ඒවාට ගොදුරුවන්නන් ගේ සිරුරු පරීක්ෂා කිරීමෙනුත් ඔවුන් ඒවායින් විඳවූ ආකාරය ගැන විස්තර වලිනුත් තමයි සැලකියයුතු නිගමනවලට පැමිණෙන්නේ. මෙහිදී වෝහාරික වෛi විiාවේත් රසායණික ඉංජිනේරු විiාවේත් පිහිට සෙවීමට අපට  සිදුවෙනවා.

නමුත් දේශපාලනික වශයෙන් වැදගත් කාරණය එය නොවේ. රසායණික අවි යුද්ධයකදී භාවිතා කරන්නේ මන්ද? යන්නයි. සහෝදරවරුනි, කෘෂිකාර්මික කටයුතුවලදී ගොවීන් කෘමිනාශක වල් නාශක පලිබෝධ පාලනය සඳහා යොදාගන්නා බව ඔබත් මාත් දන්නා දෙයක්. එම රසායණික ද්‍රව්‍ය භවිතා කරන්නේ සාමුහික වශයෙන්ම කෘමීන් හෝ පැලෑටි විනාශ කිරීමටයි. නැතහොත් සමූල ඝාතනය කිරීමටයි. ඒ වාගේම එම රසායණික ද්‍රව්‍ය වගාවට යෙදීමෙන් ඒ වගාවට හානි කළ නොකළ සෑම කෘමියෙකුමත් කෘමි වර්ගයක්මත් මියයන බව ඔබ දන්නවා. ඉන් කියැවෙන්නේ රසායන ද්‍රව්‍ය මඟින් තෝරා බේරා පහර දිය නොහැකි බවයි. රසායණික අවි භාවිතාවේදීත් තත්ත්වය එයමයි. එනම් රසායණික අවි භාවිතා කරන්නනේ සමූලඝාතන අරමුණක් වෙනුවෙන් බවයි. වැදගත් කාරණය එයයි. එයම යි.

මානුෂික මෙහෙයුම නම් යුද මෙහෙයුම කරණ ලාංකික පාලකයින්  මේ පාර දෙමළ ත්‍රස්තවාදී ව්‍යාපාරය දනගස්වන්න අවශ්‍ය තාක්ෂණික ශක්තිය තමන් සතුව ඇති බව කිහිප වතාවක්ම කියා සිටියා. විශේෂයෙන් ම අග්‍රාමාත්‍යතුමා විටින් විට මේ බව කියා සිටි අයගෙන් කෙනෙක්. ඒ තාක්ෂණික විස්තර රහසක් බවත් හෙතෙම කියා සිටියා. යුද්ධ රහස් කියල හිතාගෙන කවුරුත් ඒ කියමන් ගැන වැඩිදුර හිතුවෙත් නෑ. සෙව්වෙ බැලුවෙත් නෑ.නමුත් මේ මානුෂික මෙහෙයුම ආරම්භ කරනවාත් සමගම තියුණු මාධ්‍ය වාරණයක් යොදා ජාතික ආරක්ෂක මාධ්‍ය මධ්‍යස්ථානය නමින් යුධ තොරතුරු ඒජන්සියක් පිහිටුවීම කල්පනා කළයුතු වැදගත්ම කරුණක්. රටක වාර්ගික සිවිල් කැරැල්ලක් මර්දනය කිරීමක දී මෙවැනි මාධ්‍ය මෙහෙයුමක් කුමකටද? තොරතුරු වසන් කරන්නේ ඇයි? ඒවා වසන් කරන්නේ කා ගෙන්ද? එහි ඇති ලාභය කුමක්ද? අර්බුදය විසැඳීමට පාර්ලිමේන්තුවාදී අරමුණක් හෝ මූලධාර්මික අර්ථයකින් කියනවානම් ප්‍රජාතාන්ත්‍රවාදී අරමුණක්
[illegible] ෝධය,
[illegible] මෙන්
[illegible] ර්රුම්

pdfMachine
Is a pdf writer that produces quality PDF files with ease!
Produce quality PDF files in seconds and preserve the integrity of your original documents. Compatible across nearly all Windows platforms, if you can print from a windows application you can use pdfMachine.
Get yours now!

යන සැබෑම දේ නම් සඟවන්නට රහසක් ආණ්ඩුවට තිබෙන බවයි. කුමක්ද? ඒ රහස. යම් යම් මාධ්‍ය කරුවන් ලාංකික රණ බිමේ ඇති විශේෂයෙන්ම කොටි සංවිධානය අත ඇති රසායණික අවි ගැන හෙළිදරව් කිරීම් කළා. ලංකාවේ ඉක්බාල් අතාස් මහතා ඉන් එක් අයෙක්. විදේශීය මාධ්‍ය මගිනුත් ඒ හෙළිදරව් කිරීම් කර තිබුණා. එම අවස්ථාවලදී කොටි සංවිධානයටත් වඩා කලබල වූයේ ආණ්ඩුවයි. ලංකාවේ රසායණික අවි භාවිතයක් ඇත්තේ නැති බවටත් කොටි සංවිධානය අතවත් එවැනි රසායණික අවි නැති බවටත් අගමැතිවරයා ප්‍රසිද්ධියේම සහතික කොට සිටියා. එහෙම රසායණික අවි තියෙනවානම් බුද්ධි අංශ මගින් ඒ ගැන තොරතුරු හෙළි කරන බවත් ඔහු කියා සිටියා.

නමුත්, උතුරු යුධ පෙරමුණේ සටන් කරමින් සිටි විශේෂ බලකායට අයත් සෙබලුන් පිරිසක් රසායණික අවි ප්‍රහාරයකට ගොදුරු වී මිය යාමත් සමඟ අගමැති වරයාගේ සහතිකවීම තවත් සැකයට ලක් වුණා. ඒ හමුදා මළ සිරුරු වල පටක වලට දැඩි හානි සිදු වී තිබීමත් අක්ෂි පටල පිලිස්සී ගොස් තිබීමත් නිසා භාවිතා වී ඇති රසායණික අවිය ගැන දළ වැටහීමකට පැමිනිය හැකියි. එනම් මෙය චර්මයට පටකවලට හානි සිදු කරන අවි වර්ගයක් බවයි. ඉරාණ-ඉරාක යුද්ධයේදී මෙවැනි අවි භාවිතා වුණා.

සහෝදරවරුනි, ලෝකයේ දනට සුලභව භාවිතාවන රසායණික අවි වර්ග මූලික භාණ්ඩ තුනකට වෙන් කෙරෙනවා. මිනිස් සිරුරට ඒවායින් ඇති කෙරෙන හානියේ හැටියටයි ඒ භාණ්ඩ වෙන් කිරීම සිදු කරන්නේ. එක් වර්ගයක් සිරුරේ ස්නායු පද්ධතියට හානි සිදු කෙරෙනවා. ඒවා ප්‍රධාන වශයෙන් සයනයිට් සංඝටකය මුල් කරගෙන නිපැදවෙන ඒවා. මීතයිල් අයිසො සයනයිට් හෙවත් සැරීන් යන කෙටි නමින් හැඳින්වෙන වර්ගය ඉන් එකක්. එය නාගයාගේ ඇති සල්ෆියුරික් සයනයිට් වැනි එකක්. නමුත් එය ඊට වඩා දහස් වාරයක් පමණ දරුණුයි. ඉන්දියාවේ භෝපාල් ඛේධවාචකයට හේතු වුනේත් ඊට කිට්ටු රසායණික වායුවක්. සෝකෝ අසහාරා නමින් කලකට පෙර බුදු කෙනෙක් හැටියට ලංකාවේ ඇතැමුන් පවා පිලිගත් ජපන් ජාතික උමතු මිනිසා ඔහුගේ කල්ප විනාශවාදී ආගමික පිලිගැනීමට අනුව සියළු මිනිසුන් නැසීමට මෙම රසායනික වායුව භාවිතා කළා. ඒ වරදට ඔහු ට ජපන් අධිකරණයෙන් මරණ දඬුවම ලබා දුන්නා.

තවත් වර්ගයක් වන්නේ සිරුරේ පටක, පටල හා චර්මය ආදියට හානි ගෙන දෙන වර්යයි. එසේ හානි වීමෙන් පසු පුද්ගලයා මරණයට පත් වනවා. ජීවත් වුනත් ඔහුගේ ඇස් අන්ධ වනවා. එම වර්ගය කෙටියෙන් හඳුන්වන්නේ මස්ටර්ඩ් යන නමිනුයි. මස්ටර්ඩ් කියන්නේ අබ වලටයි. එම අවියට ඒ නම ලැබිල තිබෙන්නේ එහි සුවඳ අබ සුවඳට තරමක් සමාන කමක් දක්වන නිසයි. නමුත් මෙම වර්ගය මිලිටරි ශබ්දකෝශයේ කඳුළු ගෑස් හෙවත් ටියර් ගෑස් යන අනවර්ත නමිනුත් හැඳින්වෙනවා. ටියර් ගෑස් නැත්නම් කඳුළු ගෑස් යන වචනය යෙදුවාට එය කැරලි මර්දන පොලීසිය භාවිතා කරන ටියර් ගෑස් නොවේ. ටියර් ගෑස් යන නම එයට ලැබිල තියෙන්නේ එම මස්ටර්ඩ් අවි ප්‍රහාරයට ගොදුරු වූ කෙනාගේත් මුලින්ම දෑස් දැවිල්ලක් ඇතිවන නිසයි.

ඊළඟ වර්ගය ලෙස කියන්නට තියෙන්නේ ශරීරය පුලුස්සා දමන වර්ගයයි. අධික උෂ්ණත්වය නිසාත් පිපිරීමෙන් ක්ෂණිකව ඇති කෙරෙන වායු ප්‍රසාරණය මගින් ඇති කෙරෙන ගර්ෂණය නිසාත් මෙම පිලිස්සීම් සිදුකෙරෙනවා. කිරන කදම්බ සලකුණු මියගිය හෝ ප්‍රහාරයට ගොදුරු වූ ශරීරයේ දකින්නට ලැබෙනවා. ඇත්ත වශයෙන්ම සිරුර රෝස් වෙනවා. ද්‍රව නයිට්‍රජන් හෝ වෙනත් සමාන්තර වායූන් යොදා මෙම අවි තනනවා. තර්මෝ-බැරික් නමින් හැඳින් වෙන්නේ එවැනි අවි වර්ගයක්. මිලේනියම් සිටි සිද්ධියේදී එම අවි අතුරුගිරියේ දිග-දුර විහිදුම් බලකාය හෙවත් මහසෝනා බලකාය විසින් භාවිතා කළ බවට ඒ කාලයේ කතාබහ කෙරුණා. එම අවිය මිලිටරි වහරෙහි විකිරණ රහිත න්‍යෂ්ටික බෝම්බය ලෙසත් හැඳින්වෙනවා.

ලංකාවේ හමුදා නිලධාරීන් විශේෂයෙන් ම කාලතුවක්කු බලකායේ සොල්දාදුවන් හා නිලධාරීන් තමන් කොටින්ට එරෙහිව කඳුළු ගෑස් වැනි රසායණික අවියක් කලක සිටම උතුරු යුධ පෙරමුණේ දී භාවිතා කර ඇති බවටත්, ඒ අවියෙන් පහරදුන්නාට පසු කොටි ඇතට දුවන බවටත් තොරතුරු හෙළි කර තිබෙනවා. ඔවුන් සිතා සිටින්නේ තමන් හානියෙන් අඩු අහිංසක අවියක් භාවිතා කරන බවයි. නමුත් සත්‍යය එය නොවෙයි. එක්සත් ජාතීන් ගේ සංවිධානය විසින් සමූහ ඝාතක අවි හැටියට නම් කොට 1998 දී සහතික කළ අවි වලට එය අයිතියි. එම අවිය භාවිතා කොට පුද්ගලයන් තෝරා බේරා පහර දෙන්නට නොහැකියි. තෝරා බේරා පහර දෙන්නට බැරි අවි සමූහ ඝාතක අවි හැටියටයි ගනන් ගැනෙන්නේ. එය හරියට ගොයම් මැසි බෙහෙත් වගෙයි. සිවිල් වැසියන් ට හානි නොවන්න එම අවියෙන් පහර දෙන්නට බැහැ. මේ නිසා කාරණය
[illegible] ය්
[illegible] ම.

pdfMachine
Is a pdf writer that produces quality PDF files with ease!
Produce quality PDF files in seconds and preserve the integrity of your original documents. Compatible across nearly all Windows platforms, if you can print from a windows application you can use pdfMachine.
Get yours now!

රටක සිවිල් කැරැල්ලක් මර්දනය කරන්නට, විශේෂයෙන් ම වාර්ගික සිවිල් කැරැල්ලක් මර්දනය කරන්නට යාමේදී රසායණික අවි භාවිතා කරනවානම්, සමූහ ඝාතක අරමුණක් ඒ සමඟ සම්බන්ධවෙනවා. එවිට එය යුද්ධ අපරාධයක්. ජර්මනියේ ආඥාදායක හර් හිට්ලර් ගෙන ගිය යුද්ධය ඒ වාගේ එකක්. සර්බියාවේ ස්ලෙබොඩාන් මෙලිසොවිච් ගෙන ගිය යුද්ධයත් ඒ ජාතියේ ම එකක්. ඒ යුද්ධවලින් ඒ රටවල් වලට කුමක් සිදුවුනාද කියා ඔබ කවුරුත් දන්නවා. කාලය තිබෙනවානම් තවත් උදාහරණ දෙන්න පුළුවන්. නමුත් කාලය නැහැ. ලෝක සම්මත ප්‍රජාතන්ත්‍රවාදී මාර්ගයෙන් ප්‍රශ්ණ විසඳනවා වෙනුවට එවැනි සමූහ ඝාතක විසැඳුම් වලට යොමු වූ විට එම ගැටළු විසැඳීමට මැදිහත් වීමට එක්සත් ජාතීන්ට සිදු වෙනවා. රටක වාර්ගික කැරැල්ලක් පාලනය කරන්නට කියා එම ජන වර්ගයම සමූල ඝාතනය කිරීම එක්සත් ජාතීන්ගේ සංවිධානය අනුමත නොකරන බව ආණ්ඩුව දන්නවා. රසායණික අවි භාවිතාකිරීම ගැන තොරතුරු හෙලි නොවීමට එක් ප්‍රධාන හේතුවක් වුණේ එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් එය වසන් කිරීමට උවමනාවක් තිබුණ නිසා විය යුතුයි. රසායණික අවි නොවෙයි පරමාණු බෝම්බ හෝ හෙලා දෙමළ ජාතිය ඉවරයක් කරන්නට බහුතර මාධ්‍ය වේදීන් අතර ඇති කැමැත්ත තවත් හේතුවක්.

සහෝදරවරුනි, මෙහිදී අපට වැදගත් වන කාරණයක් නම්, සමූහ ඝාතක යුද්ධයක් හඳුනාගන්නේ රසායණික අවි භාවිතය නිසා පමණක්මද, යන්නයි. නැහැ. ඊට නිශ්චිත හේතු තිබෙනවා. ඉන් ප්‍රධාන කාරණා කීපයක් පමණක් මා සඳහන් කරන්න කැමැතියි. සාකච්ඡාවේදී විස්තරාත්මකව කතා කළ හැකියි. සමූලඝාතන යුද්ධයකට සමූලඝාතන මතවාදයක් දර්ශණයක් අවශ්‍යයයි. ඒ කෙන් කියන්නේ සතුරන් හැටියට සලකන ජාතිය හරි, ජන කණ්ඩායම හරි, ඒ නිශ්චිත භූමියෙන් තුරන් කළ යුතුයැයි කියල ඉතිහාසය තුලින් දේශපාලනය තුලින්, සංස්කෘතිය කලාව ආදිය තුලින් සමාජ විද්‍යාව තුලින් විශ්වාසයක් සාධාරණ පිළිගැනීමක් බලය ඇති ජාතිය තුළ ඇති කර තිබීමයි. මට හිතෙන හැටියටනම් ඒ අන්දමේ දර්ශණයක් ලංකාවේ බහුතර සිංහල ජනවර්ගය අතර තිබෙනවා. සාහිත්‍යය, නිර්මාණ කලාව, සිනමාව, අධ්‍යාපනය, ජන වහර ආදිය තුලින් එය නිරූපනය වෙනවා. ඒක සිංහළ ජනවර්ගයේ සාමාන්‍ය ජනතාව අතර තිබෙන එක නොවෙයි ප්‍රශ්ණය, සමාජයේ පෞරුෂය තනණ මතවාදී සමාජය අතර තිබීමයි. සාමාන්‍ය ජනයා නොමඟ හරින්නේ ඔවුනුයි. ලංකාවේ ඉතිහාසය සහ සංස්කෘතිය ගොඩනගා ඇත්තේ සිංහලුන් විසින් පමණක් යැයි යන අදහස ඊට උදාහරණයක්. මේවාට විද්‍යාත්මක හැදෑ රීමක් හෝ පදනමක් නැහැ. නිකම්ම නිකම් ප්‍රලාප. නමුත් විද්වතුන් පවා විවාදයකින් තොරවම එය පිලිගන්නවා. මේ චින්තනයේ ආරම්භය හෝ අවසානය සාමාන්‍ය ජනතාව අතරද නැත්නම් සමාජ පෞරුෂය ගොඩනගන ප්‍රභූ සමාජය අතරද කියා සොයන්න බැහැ. ඒ තරමටම එය කාලයක් තිස්සේ වර්ධනය වෙලා. මිශ්‍ර වෙලා. එවැනි සමාජයක් වාර්ගික යුධ එලැඹුමකින් ගලවා ගැනීම පහසු නැහැ. මන්ද කියනවානම් වාර්ගික අධ්‍යාත්මයේ ගැඹුරටම එම මතවාදී විශ්වාසය කිඳා බැස තිබීමයි. ඒ නිසා ප්‍රඥාවට ඇති අවස්ථාව අඩුයි. හැඟීමට, විශ්වාසයට ඇති අවස්ථාව වැඩියි. එවැනි සමාජයක් පියවි සිහියට එලැඹෙන්නේ තමන් විශ්වාස කරන අර වාර්ගික ව්‍යාපෘතිය මුළුමනින්ම පරාජය වීම තුළිනුයි. එය සමාජයේ පෞරුෂයම බිඳවැටීමක් බව අප තේරුම් ගත යුතුයි. එසේ බිඳ වැටෙන සමාජ පෞරුෂය තිබුණු අයුරින් යලි ගොඩනැඟීම කළ නොහැකියි. ඒක හානියක්. නමුත් තත්ත්වය මේරූ පසු එවැනි සමාජයකට එය මඟහැර යන්න මාවතක් ඇත්තේ නැහැ. අද අප සිටින්නේ එබඳු පසුබිමකයි.

ඉන් පසු සමූලඝාතන යාන්ත්‍රණයකුත් අවශ්‍යයයි. මිනිසුන් පැහැරගෙන යාමටත්, පැහැරගෙන ගිය මිනිසුන් චිත්‍රවධයට පමුණුවා ඝාතනය කිරීමටත්, අවශ්‍යයනම් අතුරුදන් කිරීමටත්, ඒ මදිනම් සාක්ෂි ඇතොත් ඒ සාක්ෂි පවා අතුරුදන් කිරීමටත්, ඝාතකයන් බේරා ගැනීමට විශ්වාසවන්ත ප්‍රජාතන්ත්‍රවාදී යැයි පෙනෙන නීතිමය ආකෘතියකුත් ගොඩනැඟීම ඒ ක්‍රමයයි. මිනිසුන් පැහැරගෙන යාම ගැන ඔබ කාටත් රහසක් නොවේ. එ මෙන්ම ඒ ඝාතකයන් වෙනුවෙන් රජය ප්‍රසිද්ධියේම පෙනී සිටීම ද රහසක් නොවේ. නිශාන්ත ගජනායක සිද්ධියත් කරුණා අම්මාන් පිළිබඳ සිද්ධියත් ඊට උදාහරණයි. බිඳුනුවැව දෙමළ රැඳවියන් ඝාතනය කිරීම, ත්‍රිකුණාමලයේදී සිසුන් ඝාතනය, ස්වේච්චා සෙවකයන් ඝාතනය වැනි සිදු වීම් වලදී නීතිය හැසිරවුනු ආකාරය ඔබ කවුරුත් දන්නවා. ඒ වෙනුවෙන් පිහිටවූ ඊනියා කොමිෂන් සභා වූ කලී සත්‍ය සොයා යුක්තිය ඉෂ්ට කිරීමට නොව යුක්තිය ඉෂ්ට කරනවායැයි කියා පෙන්වීමට පිහිටවූ ඒවා බව ඔබ දන්නවා. නමුත් ඒවා ට යොදා සිටි අයගේ වාර්ගික උමතුව නිසා ඒ රැවටීමවත් හරියට කරගන්න බැරිවුනා. එම සිද්ධි වලදී ආණ්ඩුව පමණක් නොව බහුතර මාධ්‍යයද අපරාධ වෙනුවෙන් පෙනී සිටීම සැලකිල්ලට ගත යුතු කාරණයක්. වාර්ගික ගැටුම්කාරී කලාපවල මෙය සංවේදී කාරණා. පීඩාවට පත් වන්නන් වෙනුවෙන් හඬ නගන ප්‍රජාතන්ත්‍රවාදී සංවිධාන මෙන්ම පුද්ගලයන්ද දේශ ද්‍රෝහීන් ලෙස ලේබල් කිරීම සිදුකළේ මේ මාධ්‍ය … අංග … කළ

pdfMachine
Is a pdf writer that produces quality PDF files with ease!
Produce quality PDF files in seconds and preserve the integrity of your original documents. Compatible across nearly all Windows platforms, if you can print from a windows application you can use pdfMachine.
Get yours now!

ඊළඟට වැදගත් කාරණය වන්නේ සමූලඝාතන කාර්යයක් වෙනුවෙන් යොදා ගත හැකි ආකාරයේ ජන වාර්ගික සන්නද්ධ ත්‍රිවිධ හමුදාවක් සිටීද යන්නයි. ලංකාවේ යුධ හමුදාවේ සියයට අනූනමයක්ම සිටින්නේ සිංහළ ජාතිකයන් බව ඔබ කවුරුත් දන්නවා. ඔවුන් දෙමළ බස කතා කරන්න දන්නේ නැහැ. දෙමළ තෙරෙන්නේත් නැහැ. මුල් කාලයේ දෙමළ අය සිටියත් ක්‍රමයෙන් එය මේ වන විට ක්ෂය වී ගොස් තිබෙනවා. මුස්ලිම් අය සිටියත් එය ඉතා අඩු ප්‍රතිශතයක් බව කිවයුතුයි. ඇරත් ඒ අය විශේෂ සේවාවන්ට යොමු කොට තිබෙනවා. මේ නිසා මේ හමුදාව සාමාන්‍ය හමුදාවක් නොවෙයි. ඔවුන් ක්‍රියා කරන්නේ වාර්ගික විඥාණයක් අනුව බව මා කිව යුතු නැහැ. ක්‍රියාන්විතයන් මෙහෙයවන්නට ඇත්තේත් තමන් නොදන්නා බසක් කතා කරනා ජනවර්ගයක ගරිල්ලා ව්‍යාපාරයකට එරෙහිව බව අමතක නොකළ යුතුයි. ඒ වාගේ ම මේ හමුදා සොල්දාදුවන් අකුරු කියවා ඇත්තේම දෙමළ විරෝධී චින්තන විශ්වයක් තුළ බව රහසක් නොවෙයි.

ඊ ළඟ තවත් වැදගත් කාරණයක් නම්, බොහෝ කාලයක් තිස්සේ ප්‍රධාන ජනවර්ගය පූර්ණ රාජ්‍ය බලය භුක්තිවිඳිමින් සිටියත් ගරිල්ලා බලය බිඳ දැමීමට සමත් වී නොතිබීමයි. එය වෛරී චින්තනයකට මඟ පාදා තිබෙනවා. එම කාලය දශක දෙකකට වැඩියි. මේ නිසා ජනවාර්ගික කෝපයකින්ද යුද්ධ හමුදාව සන්නද්ධයි. ඒ අසමත්කම එක්තරා අන්දමක අවමානයක් හැටියටයි සිංහළ සමාජය තුළ සැලකෙන්නේ. මෙම අවමානයෙන් මිදීමේ මානසිකත්වය තුලනය කරගන්නේ රටේ දේශපාලන නායකත්වයට චෝදනා කිරීමෙන්. වීරෝධාර හමුදාව පරාජය වුණේ දේශද්‍රෝහී ආණ්ඩු විසින් පාවා දුන්න නිසාය කියා හඬක් නැගෙන්නේ ඒ නිසයි. මේ අනුව සතුරු ජනවර්ගයෙන් වාඩුව පිරිමසා ගැනීමේ පීඩනය හමුදාව වෙත තිබෙනවා. ඔවුන් කැරලි කරුවන් මෙන්ම ඒ ජනවර්ගයම සලකන්නේ සතුරන් හැටියටයි. සැම දෙමළ ජාතිකයෙකුම සැක කළ යුතුයැයි කියා කියන්නේ ඒ නිසයි. විවෘතව ප්‍රකාශ නොකළාට රජයේ නිල මතයත් එයයි. එක පාරක් කොළඹ නගරයේ, ඒ කියන්නේ රටේ අගනුවර සිටින දෙමළ නේවාසිකයන් නගරයෙන් පිටුවහල් කිරීමට ක්‍රියා කළ හැටි ඔබට මතක ඇති. ඒක කළේ ආණ්ඩුවේ ප්‍රධානීන්ගේ අනු දැනුම ඇතිවයි. හර් හිට්ලර්ගේ හමුදා යුදෙව්වන් මියුනිච් නගරයෙන් පිටුවහල් කළ ආකාරය මෙහිදී සිහියට එනවා. ඇමෙරිකානු සම්භවයක් ඇති ජපන් ජාතිකයන් කැලිෆෝනියාවෙන් පිටුවහල් කිරීමට ඇමෙරිකානු බලධාරීන් දෙවන ලෝක යුධ සමයේදී ගත් තීරණයත් ඒ වගේ එකක්. මෑත කාලයේ නාගරිකව කෙරුණ සංඝණන වැඩසටහනත් ඒ වාගේම එකක්. ඉතින් කාලයක් තිස්සේ නොනැසී පවතින වාර්ගික අභියෝගය මුලිනුපුටා දැමීමට වාර්ගික යුද්ධය දශක දෙකක් පමණ පැවතීම හොඳටම ප්‍රමාණවත් බව මගේ හැඟීමයි. මේ පසුබිම තුළ ලංකාවේ වාර්ගික සිවිල් යුද්ධය වාර්ගික සමූලඝාතන යුද්ධයක් බවට පරිවර්තනය වී තිබීම පුදුමයක් නොවෙයි. එහි රූපය මෙන්ම හරය සතුරා සමූලඝාතනය කිරීමේ අරමුණකින් යුක්තවීම අනිවාර්යයි.

සහෝදරවරුනි, මෙම වාර්ගික යුද්ධය පිළිබඳව, ඒක කරගෙන යන අයත් ඊට නියමින් සහ අනියමින් සහාය පළ කරන අයත් ඉදිරිපත්කරන ප්‍රවාද කිහිපයක් තිබෙනවා. රටේ ඉතිහාසයේ හෝ සංස්කෘතියේ අයිතියක් දායකත්වයක් දෙමළ ජාතියට නැතැයි කියල කියන පැසිස්ට් ප්‍රවාදය ඒ අතර බොහොම ප්‍රාථමික එකක්. ඒක ප්‍රවාදයකටත් වැඩිය කිට්ටුවන්නේ චින්තන සින්ඩ්‍රෝමයකටයි. ඒ කියන්නේ චින්තන තත්ත්වයක්. සංස්කෘතික ක්‍රොනික් එකක්. උදාහරණයක් වශයෙන් කියනවානම්, කොටි පාලන ප්‍රදේශවලට ආහාර ඇතුළු අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩ යැවීම ගැන ආණ්ඩුවේත් ඇතැම් උගතුන්ගේත් ආකල්පය බලන්න. අපි වෙන රටවල් වගේ නොවෙයි, සතුරා සමඟ සටන් කළත් සතුරාට කන්ඩ බොන්ඩ ටික යවනවා, අපි එහෙම මානුෂිකවයි ක්‍රියා කරන්නේ කියා ඒ අය කියනවා. ඒ අදහසේ මුල දෙමළ ප්‍රදේශ අනුන්ගේ නැත්නම් සතුරන්ගේ කොටසක්ය යන හැඟීමෙන් උපත ලබන්නක්. ඒ ප්‍රදේශවල දෙමළ ජනයා ගනු-දෙනු කරන්නේ ජාතික බැංකු සමඟ බවත් බදු ගෙවන්නේ ආණ්ඩුවට බවත් අමතක කරනවා. කොටින්ම කිවහොත් තමන්ගේම රටේ පුරවැසියන් කියල මේ අයට හිතෙන්නේ නෑ. අනියමාර්ථයෙන් වෙනම රටක්ය යන හැඟීම සිය හෘදසාක්ෂිය ඔවුන්ට කියනවා වැනියි. මේ අතර ප්‍රබුද්ධ අදහසක් වාගේ තවත් අය ඉදිරිපත් කරන ප්‍රවාදයක් තමයි මෙම යුද්ධය මඟ හැර යන්නට ආණ්ඩුවට වෙන මඟක් නැහැ කියන එක. ඒකට යම් යම් හේතු ඒ අය දක්වනවා. කොටි සංවිධානය සාමයට කැමැති නැහැ කියන එක මෙන්ම සාමය පිහිටුවන්නට විවිධ ආණ්ඩු ගත් උත්සාහ කොටි සංවිධානය විසින් කඩාකප්පල් කළා කියන කතාව ඉන් ප්‍රධානයි. එ මෙන්ම සටන් විරාම කාල වකවානු තමන්ගේ හමුදා ශක්තිය වැඩි කරගැනීමට සන්නද්ධ බලය වැඩිකර ගැනීමට මුදල් බලය තර කර ගැනීමට කොටි සංවිධානය ක්‍රියා කරනවාය කියන තර්කයත් ඊට උපයෝගී කර ගන්නවා. මේ නිසා කොටි මෙල්ල නොකොට සාමය ඇති කළ නොහැකිය කියල ඔවුන් කියනවා. මෙය සත්‍ය කරුණුවලින්

හ

pdfMachine
Is a pdf writer that produces quality PDF files with ease!
Produce quality PDF files in seconds and preserve the integrity of your original documents. Compatible across nearly all Windows platforms, if you can print from a windows application you can use pdfMachine.
Get yours now!

ඉලක්කවලට අනුවත් ක්‍රියා කරනවා. සන්නද්ධ බලය ගැන විශ්වාසය තියල ක්‍රියාකරන සංවිධාන වල හැටි සාමාන්‍ය වශයෙන් එහෙම තමයි. සාකච්ඡා කිරීම සම්මුතියට පැමිණීම වැනි දේ ඒවාට හුරු නැහැ. යම් යම් එකඟ තාවයන්ට පැමිණුනත් ඒකත් කරන්නේ සැකයක් ඇතිවයි. ඒ සැකය නැතිකිරීම පිළිබඳ මූලික වගකීම පැවරෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදය මත පිහිටා ක්‍රියා කරන හෝ ප්‍රජාතන්ත්‍රවාදය මත පිහිටා ක්‍රියා කළ යුතු ආණ්ඩුවටයි. ඒ වාගේම සිවිල් සංවිධාන හා සමාජයටයි. නමුත් ඒ ටික ආණ්ඩුවවත් සිවිල් සංවිධානවත් ප්‍රමාණවත් මට්ටමින් කර ඇතැයි කියා මා නම් විශ්වාස කරන්නේ නෑ. ඉන්දු-ලංකා ගිවිසුම යටතේ පලාත් සභා යෝජනා ඉදිරි පත් වූ වේලේ ඊට එරෙහිව මුලු වැර යොදා සිංහල සමාජය ක්‍රියා කළ බවත්, පරිපාලනමය උපාමාරු මඟින් එම පලාත් බලය තහවුරු වීම වැලැක්වීමට රාජ්‍ය යන්ත්‍රය ක්‍රියා කළ බවත් මෙහිදී මා කිව යුතුයි. දෙමල ගරිල්ලා ව්‍යාපාරය ඉන්දු-ලංකා ගිවිසුමෙන් ඉවත් වීමට ක්‍රියා කළාට වඩා වැඩි වුවමනාවකින් දකුණේ සිංහල සමාජය ඉන් ඉවත්වීමට ක්‍රියා කළ බව ඔය තර්කය ඉදිරිපත් කරන අය අමතක කරනවා. දෙමළ ප්‍රජාතාන්ත්‍රික දේශපාලන පක්ෂ දශක හය හතක් තිස්සේ කරගෙන ගිය පාර්ලිමේන්තුමය ශිෂ්ටසම්පන්න ව්‍යාපාරය නින්දා සහගත ලෙස පරිහාසයට, අපහාසයට, අවඥාවට, පාවාදීමට ලක් කිරීමට ආණ්ඩු ක්‍රියා කිරීම නිසාම ඒ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහය කෙරෙහි විශ්වාසය තබන්නට කොටි සංවිධානය වැනි සන්නද්ධ මිලිටරි ව්‍යාපාරයක් පසුබට වීම පුදුමයක් නොවන බව ඔබ තේරුම් ගත යුතුයි. දෙමළ පාර්ලිමේන්තු මංත්‍රීවරුන් කිහිප පොලක්ම මෑත වකවානුවේදී ඝාතනය කළ බවත් තවත් අයට ජීවිත තර්ජන එල්ල කර ඇති බවත් ඒ වගේම මුස්ලිම් දේශපාලන පක්ෂ වල ස්වාධීන පැවැත්මට එරෙහිව පවා කුමණ්ත්‍රණ කරන බවත් ඔබ සැවොම දන්නා දෙයක්. ඉන් කියා දෙන පාඩම කුමක්ද? ප්‍රජාතන්ත්‍රවාදී මාවතේ නුඹලාට ඉඩක් නෑ කියනඑක නොවේද? එවැනි අශීලාචාර අතීතයක් හා වර්තමානයක් ඇති දේශපාලන පක්ෂ හා නායකත්වයක් කෙරෙහි ගරිල්ලා ව්‍යාපාරයක් තබා පීඩාවට පත් ජනවර්ගයවත් විශ්වාසය තබන්නේ නෑ. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදී සම්මුතිවාදී ව්‍යාපෘති ගැන විශ්වාසය තහවුරු කිරීම සිංහල දේශපාලන නායකත්වයට පැවරෙන වගකීමක්. මන්ද කියනවානම්, සම්මුති හා ගිවිසුම් ඉරා දමා කඩාකප්පල් කිරීමේ නො මැකෙන කැළැල් සහිත ඉතිහාසයක් සිංහල නායකත්වයට ඇති නිසයි. පළමුවෙන් ආණ්ඩුව තමන්ගේ කිලිටි සෝදාගෙන පිරිසිදු විය යුතුයි. ඉතින් යාන්ත්‍රික වට්ටෝරුවකට අනුව කොටි අර වැරැද්ද කළේ නැද්ද මේ වැරැද්ද කළේ නැද්ද කියල, අරකට ලකුණු මෙච්චරයි මේකට ලකුණු මෙච්චරයි කියල කරුණු පෙන්නන්න කෙනෙකුට පුලුවන්. නමුත් ඒකෙන් වැඩක් නෑ. ඒ කරුණුත් සත්‍ය වන්නට පුලුවන්, නමුත් සම්පූරණ සත්‍ය නෙවෙයි. සත්‍යයෙන් කොටසක් පමණයි. එ තැනයි වැරැද්ද තියෙන්නේ. වෙනත් වචනවලින් කියනවානම් මෙය ප්‍රජාතන්ත්‍රවාදය සහ සන්නද්ධ විශ්වාසය අතර ගනුදෙනුවක්. ප්‍රජාතන්ත්‍රවාදයේ ශක්තිය, විශ්වාසය, බලය හා ලාභය සාර්ථකව අලෙවි කරන්නට ආණ්ඩුව සමත් වුණොත් ආණ්ඩුව ගණු දෙනුවෙන් ජය ගන්නවා. එහි අගුණ පෙන්වා සන්නද්ධ ක්‍රියාමාර්ගයේ සාර්ථකත්වය ගැන කියා එය අලෙවි කරගන්නට කොටි සංවිධානය සමත් වෙතොත් ගණු-දෙණුවෙන් කොටි සංවිධානය ජය ගන්නවා. මේ භාණ්ඩ දෙකම මිල දී ගන්නේ මේ රටේ සාමාන්‍ය සිංහළ-දෙමළ ජනතාවයි. පෙනෙන හැටියට ආණ්ඩුව අලෙවිකරණයෙන් පරාජය වී තිබෙනවා. හේතුව ආණ්ඩුවත් සන්නද්ධ ක්‍රමයම අලෙවි කරන්නට යාම නිසයි. අංගුලිමාල ඉදිරියේ, ඇඟිලි කැපීමට වඩාත් ශූර තමන් වහන්සේ යැයි පෙන්වීමට ගෞතම බුදුන් ක්‍රියා කළේ නම් තත්ත්වය කුමක් වන්නට ඉඩ තිබ්ණිද?

මෙම අර්බුදයේදී කොටි සංවිධානය දරන්නේ සන්නද්ධ මාර්ගයේ කේන්ද්‍රයයි, නමුත් ඡන්දයෙන් පත් වූ ආණ්ඩුව දරන්නේ හෝ දැරිය යුත්තේ ප්‍රජාතන්ත්‍රවාදයේ කේන්ද්‍රයයි. නැත්නම් පාර්ලිමේන්තුවාදයේ කේන්ද්‍රයයි. අප එය නිවැරදිව නිශ්චිතව තේරුම් ගත යුතුමයි. මන්ද කියනවානම්. ප්‍රජාතන්ත්‍රවාදයේ පාර්ලිමේන්තු ක්‍රමයේ කේන්ද්‍රයෙන් මහජන ඡන්දයෙන් බලයට පත්වන ආණ්ඩුවක් ඉවත්වන්නට ක්‍රියා කළහොත් බිඳ වැටෙන්නේ සමස්ථ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයයි. තහවුරු වන්නේ සන්නද්ධ සටන් මාර්ගයයි. මහජනතාවට තෝරාගැනීමට මාර්ගයක් නැතිවෙනවා. එයින් රටේ මුලු ජනතාවටම පීඩා විඳින්නට සිදුවෙනවා. නීතියේ බිඳ වැටීම වරප්‍රසාද අඩු බහුතර ජනතාවගේ ඞකවරණය අහෝසිවීම ඒ මඟින් බලාලොරොත්තු වියයුතු වනවා. කොටින්ම කියනවානම් තමන් ගැන බලා කියා ගන්නට තමන්ටම සිද්ද වෙනවා. අවසානයේදී ළදරුවෙකුටවත් ඞකවරණයක් නැති තත්ත්වයක් ඇතිවෙනවා. අරාජික තත්ත්වයක් හැටියට සමාජ විiාඥයන් දේශපාලන විචාරකයන් හඳුන්වන්නේ එයයි. මධ්‍යම අප්‍රිකාවේ රාජ්‍යයන් කිහිපයකම මෙවැනි තත්ත්වයක් දකින්නට පුලුවන්. නමුත් ඒ අප්‍රිකානු රාජ්‍යයන් වාගේ නොවෙයි වර්ධිත ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක ජීවත් වූ රටක පුරවැසියන් වන ඔබට එය දරා ගැනීම ලේසි නැහැ. ඒක හරියට ගහක පහල අත්තක ඉඳල බිමට වැටෙන මිනිහාත් ගහක ඉහල අත්තක ඉඳල බිමට වැටෙන මිනිහාත් විඳින වෙනස් වූ අත්දැකීමට සමාන කළ හැකියි. දුගියෙකුගේ කුසගින්නට වඩා සිටුවරයෙකුගේ කුසගින්න දරුණුබව ඔබ තේරුම් ගත යුතුයි.

...වකට

...න්නේ

pdfMachine
Is a pdf writer that produces quality PDF files with ease!
Produce quality PDF files in seconds and preserve the integrity of your original documents. Compatible across nearly all Windows platforms, if you can print from a windows application you can use pdfMachine.
Get yours now!

සහෝදරවරුනි, නමුත් ඔනෑම අලාභයක් වෙච්චදෙන් කියල එබඳු මාර්ගයකට ආණ්ඩුව ඇතුලුවූයේ ඇයි? ඔවුන්ට මෙය නොතේරෙන නිසාද? මානම් සිතන්නේ එය අර සමූලඝාතන සැලැස්ම ගැන ඇති විශ්වාසය නිසා සිදු වූවක්ය යන්නයි. ආණ්ඩුවට යුද්ධය මඟ හැර යාමට බැරිවූයේ කොටි සංවිධානය ප්‍රජාතන්ත්‍රවාදය ගැන විශ්වාස නොකිරීම නිසා නොව ආණ්ඩුවට ප්‍රජාතන්ත්‍රවාදය ගැන විශ්වාසයක් නොමැතිවීම නිසයි. එ මෙන්ම සමූලඝාතනයකින් දෙමල ප්‍රජාව යටත් කරගත හැකිය යන සැලැස්ම ගැන ඇති විශ්වාසය නිසයි. තවත් විදියකින් කියනවානම් මෙය අවසන් අරමුණ ගැන ප්‍රශ්ණයක් සාකච්ඡාව හා සම්මුතිය ගැන ආණ්ඩුවට ද විශ්වාසයක් නැහැ. තම දේශපාලන කඳවුරේම සගයන් සමඟ පවා ඇතිකරගන්නා සම්මුති බිඳ දමන්නේ ඒ නිසායි. අර විචාරකයන්ගේ අසම්පූරණකම දනෙන්නේ ආණ්ඩු සිය වගකීමෙන් බැහැර වී ක්‍රියා කිරීම ගැන වැදගත් කරුණු ඔවුන් අතින් ගිලිහී තිබීම නිසයි. ඔවුන් අත ඇති කරුණු හුදු කරුණු වශයෙන් සත්‍ය නමුත් ඒවා නිවැරදි නිගමනවලට බැසීමට ප්‍රමාණවත් නැති නිසයි. ඒ නිසා විකෘති නිගමන ඇතිවෙනවා.යුද්ධ කිරීම හැර මෙම ප්‍රශ්ණයට වෙනත් විකල්පයක් නැතැයි කියල ඒ අය කියන කියමන සාවiවන්නේ ඒ නිසයි.

සහෝදරවරුනි, අප මෙම යුද්ධයට විරුද්ධ විය යුත්තේ මන්ද? එය සමූලඝාතක යුද්ධයක් නිසාද? කුඩා ළමුන් ස්ත්‍රීන් නිරායුධ සිවිල් වැසියන් ඊට ගොදුරුවන නිසාද? ගරිල්ලා ව්‍යාපාරය පරාජය වේයැයි සිතා ඒ ගැන ඇති අසතුටක් නිසාද? ලංකාවේ හමුදාව යම් වෙලාවක යුද්ධයෙන් පරාජිත වුවහොත් සිංහළ ජාතිය අවමානයට පත්වන නිසාද? නැත්නම් ජයග්‍රහණයේ වාසිය අප අකමැති දේශපාලන පක්ෂයක් අතට පත් වේ යැයි කියල තියෙන බිය නිසාද? මෙම යුද්ධය සම්බන්ධ ස්ථාවරවලට බොහොමයක් දෙනා පැමිණිලා තියෙන්නේ ඔය වාගේ ආකල්ප මත බව මගේ හැඟීමයි. ඒ වාගේම ඒ අයට යුද්ධය ගැන මූලික මූලධාර්මික පදනමක් නැති බවත් පෙනෙනවා. බැලූ බැල්මට ඒ එකිණෙකා අතර න්‍යායික මතභේද ඇතිවා වාගේ පෙනුනත් මූලික වශයෙන් ඔවුන් පය ගසා සිටින්නේ එකම න්‍යායික රාමුවක් හෙවත් ප්‍රොබ්ලමැටික් එකක් තුලයි. අපි ඒ ගැන තරමක් සියුම්ව කල්පනා කළයුතු බව මගේ හැඟීමයි. මා එසේ කියන්නේ හේතු ඇතිවයි. මේ උදවිය කවුරුත් මූලික වශයෙන් මෙම යුද්ධ කිරීමට විරුද්ධ නැහැ. ඇතැම් අය කියනවා තමන් බලයේ ඉන්නවානම් මේ යුද්ධය දැන් කරනවාට වඩා හොඳට කරනවා කියලා. තවත් අය කියනවා මෙතැන තියෙන වැරැද්ද වෙන මොකක්වත් නොවෙයි ආණ්ඩුවෙ කිහප දෙනෙක් එකතුවෙලා යුද්දෙන් ගසාකන එක කියලා. ඉතින් ඒ කවුරුත් දෙනා යුද්ධයට විරුද්ධවන්නේ යුද්ධ ක්‍රියාමාර්ගයේ සමස්ථ වරදක් නිසා නොවේ. ආකාරයේ අඩුපාඩුකම් නිසයි. ඒ අතර තවත් අය කියන්නේ තමන් ත්‍රස්තවාදයට එරෙහිව කරන යුද්ධයට විරුද්ධ නැහැ නමුත් දෙමළ ජනයාගේ අයිතිවාසිකම් නොදී සිටීමට විරුද්ධ බවයි. ත්‍රස්තවාදී ක්‍රියාමාර්ගවලට ඇතුල්වීමට පෙර ඒ අයිතිවාසිකම් නොදී සිටියේ මන්ද යන ප්‍රශ්ණයට ඒකෙන් උත්තරයක් ලැබෙන්නේ නැහැ. ත්‍රස්තවාදය වූකලී සටන් විධික්‍රමයක් බවත් එය අර අයිතිවාසිකම් ලබා ගැනීමට අඛණ්ඩව දෙමළ සමාජය ගෙන ගිය අරගලයේ වර්තමාන රූපය බවත් මගේ විශ්වාසයයි. අයිතිවාසිකම් සහ සටන්ක්‍රමය දෙකක් වශයෙන් වෙන් කොට එහි ඇති දයලෙක්තික සම්බන්ධතාවය බිඳ කල්පනා කිරීමෙන් සිදුවන්නේ මං මුලාවීම පමණයි. ත්‍රස්තවාදී ක්‍රියාමාර්ගයට එළැඹී සිටින දරුවන්ගේ පෙර පරම්පරාව සිටියේ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයේ බව අප අමතක නොකළ යුතුයි. මේ නිසා දෙමළ ජාතියේ අයිතිවාසිකම් ලබාදීමට පෙනීසිටින අතරම ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමේ සටන ට පක්ෂවන්නට බැහැ. මන්ද කියනවානම් ත්‍රස්තවාදයට අවකාශය සපයා ඇත්තේ අර අයිතිවාසිකම් ලබා නොදී ඊට අවහිර කිරීම තුළයි.

මාක්ස්වාදීන් මේ වාර්ගික යුද්ධයට විරුද්ධවන්නේ අර යම් යම් අය දක්වන හේතු නිසා නොවේ. පැහැදිලි ලෙසම වාර්ගික අර්බුදයේ ඇති තියුණු දයලෙක්තික සම්බන්ධතාය තේරුම් ගැනීම තුළයි. හෙවත් හේතු-ඵල සම්බන්ධතාවය තේරුම් ගැනීම තුළයි. යුද්ධය මේ ගැටලුව විසැඳීමට මාර්ගය නොවන නිසයි. යුද්ධයෙන් දිනන්නේ කවුරුන්ද යන්න කියා මාක්සවාදීන් ඉව අල්ලන්නේ නැහැ. ඇතැමුන් භූගෝල සිතියම් මේස මත එලා යුද්ධයේ තත්ත්වය ගැන මැන බලනවා. නමුත් ඒ මැනිල්ලෙන් මේ භූගෝලීය සියමෙන් නොපෙනෙන යථාර්ථයක් ඇතිබව ඒ අයට පෙනෙන්නේ නෑ. ඔය භූගෝල සිතියමට වෙනස්ව ජනවාර්ගික සිතියමකුත් තියෙනවා, ඒ කියන්නේ මානව සිතියමකුත් තියෙනවා. මානව සිතියම ක්‍රියාත්මක වන්නේ භූ සිතියමට වෙනස්වයි. ලංකා දූපතේ උතුරු-නැගෙනහිර තැනිතලාව සිය වාසභූමිය කොට ගෙන ජීවත්වන දෙමළ ජනතාව ලාංකිකයන් වුවත් ඉන්දියාවේ දකුණේ විශාල භූමි භාගයක එ බඳුම දෙමළ ජනගහනයක් සිය වාසභූමිය කොටගෙන ජීවත් වෙනවා. පොදුවේ සලකන විට මානව සිතියම විසින් ඉංදියාවේත් ලංකාවේත් භූ බෙදීම් සන්ධි වී තිබෙනවා. වාර්ගික අර්ථයෙන් සන්නද්ධ ගැටුම් උත්සන්න වනවිට මානව සිතියම්වල මායිම් ශක්තිමත්වීම බලා පොරොත්තුවිය යුතුයි. දේශපාලන බෙදීම් හා භූගෝලීය බෙදීම් ඉක්මවමින් [illegible]

**pdfMachine**
**Is a pdf writer that produces quality PDF files with ease!**
Produce quality PDF files in seconds and preserve the integrity of your original documents. Compatible across nearly all Windows platforms, if you can print from a windows application you can use pdfMachine.
Get yours now!

අර්බුදය යුද්ධ මාර්ගයෙන් සමූලඝාතන මාර්ගයට මාරුවුනත් තව කොපමණ කල් වෙඩිතබා ගත්තත් කෙලවරක් නොදකින්නේ අන්න ඒ නිසයි. එවැනි කෙලවරක් නොදකින යුද්ධයකට ඇතුළු වීම මෝඩකමක් යුද්ධ සිතියමේ සීමා දූන් පෙනෙනවාට වඩා සැබවින්ම විශාල නිසයි.

අනෙක් අතට දෙමළ ජනයා සිංහල ජාතියේ නායකත්වය පිළිගන්නට ජාතියක් වශයෙන් කැමැති වනතාක් කල් එසේ නායකත්වය දෙන්නට තරම් සිංහල නායකත්වය පරිණත වන තාක්කල් එහෙමත් නැත්නම් ජාතීන් දෙකම එකිනෙකාට යටත් නැති සමාන්තර බලයක් ඇතිව ආණ්ඩුකරගන්නට කැමැතිවන තාක්කල් සටන නොනවතින බව නිසැකවම පැහැදිලි කාරණයක්. ශ්‍රී ලංකාවේ වාර්ගික යුද්ධයක රූපයෙන් පවතින්නේ සමාජ සමානත්වය හා නිදහස පිළිබඳ ගැඹුරු සමාජ අර්බුදයක්ය යනුවෙන්  තේරුම් ගැනීමකට අප පැමිණියහොත් සමාජ අර්බුදයකට ඇත්තේ ඉල්ලීම් සොයා බලා සම්මුතියට පැමිණ අර්බුදය කළමණාකර ගැනීමක් මිස යුද්ධ කිරීම නොවන බව අපට තීරණය කළ හැකියි. එ විටම අප වෙත එල්ලවන ප්‍රශ්ණය වන්නේ සන්නද්ධ ගරිල්ලා ව්‍යාපාරය නිරායුධ කරන්නේ කෙසේද යන්නයි. සන්නද්ධ ව්‍යාපාරයක පැවැත්මට ඇති අවකාශය අහෝසිකිරීම ප්‍රශ්ණයට පිළිතුර බව මාක්ස්වාදීන් වන ඔබ දන්නා බව මා දන්නවා. අවකාශය අහෝසි කිරීම යනු සංයුක්තව කියනවානම් දෙමළ ජනතාවගේ විශ්වාසය තහවුරුවන පරිදි, නිදහස සහතිකවන පරිදි, සමාජ සංවර්ධන අභිලාශයන් ඉටුවන පරිදි, බලය හා අවස්ථාව සමානව බෙදෙන පාර්ලිමේන්තුමය විසැඳුමක් බව කිව හැකියි. එය මූලික අර්බුදයටත් විසැඳුම බව පැහැදිලියි. නමුත් එපමණක්ම නොවේ. යුද්ධයට එරෙහි වීමට න්‍යායික මැග්නකාටාවක් පැහැදිලි වශයෙන්ම මාක්ස්වාදීන්ට තිබෙනවා. එය කුමක්ද? මාගේ මේ අදහස් දැක්වීමේ මූලික අරමුණත් එය ඔබ ඉදිරියේ සංවාදයට තැබීමයි.

සහෝදරවරුනි, මානවයාගේ ඉතිහාසය වූ කලී අතීතයේ සිට අද දක්වා දිග හැරී ඇති, සටන් හා යුධ ගැටුම් වලින් පිරි, කලාලයක් යැයි කිවහොත් එය අතිශයෝක්තියක් නොවේ. මිනිසා ශිෂ්ටාචාරයක් ගොඩනැගීම ආරම්භ කිරීමෙන් පසුවත් ලේ වැකි යුද්ධවලින් ඉවත්වූයේ නැත. තිරිසන් සතුන්ට සමානවම මුල් කාලයේ දී ආහාර, ලිංගිකත්වය හා ලැගුම් පොලවල් වෙනුවෙන් ගහ-මරා ගත් නමුත් ඔහු ක්‍රමයෙන් රංචුව, භූමිය, නායකත්වය, දේපල හා ආරක්ෂාව (භය) වෙනුවෙන්ද යුධගැටුම්වල අරමුණු පුළුල් කරගත්තේය. යටත් විජිත යුද්ධ මෙන්ම සම්පත් පැහැරගැනීමේ යුද්ධත් ශිෂ්ට මිනිසාගේ අරමුණු වල පුළුල්වීම මතම සිදුවූ හා සිදුවන යුද්ධ බව කිව යුතුයි. එහෙත් ශිෂ්ටත්වයේ ඉහල අවදියකදී අරමුණ පුළුල්වීම නිසාම යුද්ධකිරීමේ අවශ්‍යතාවය අහෝසිවන බව මාගේ කල්පනාවයි. යුද්ධ ඇත්තේ පාර්ශව දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතරනම් උසස් ශිෂ්ටාචාර අවදියකදී පාර්ශව අහෝසි වන බැවින්, දේශ සීමා ලිහිල්වන බැවින්, යුද්ධයට ඇති  අවකාශය කුමක්ද? යුරෝපියානු සංගමය ගොඩ නැගුණු හැටි දෙස මඳක් බලන්න, මා මෙයින් අදහස් කරන්නේ න්‍යායික වශයෙන් ගෝලීය සමාජ ශිෂ්ටාචාරයක් තුළ යුද්ධයට අවකාශයක් අවශ්‍යතාවයක් නැති වන බවයි.

මේ වනවිට ගොඩ නැගෙමින් ඇත්තේ ගෝලීය සමාජයකි. විශ්ව සමාජයකි. විශ්ව සමාජයක ප්‍රමිතීන් යමෙකු උල්ලංඝනය කළහොත් ඒකෙ විපාකය මුලු විශ්ව සමාජයම දැරිය යුතු වෙනවා. ඒ අන්දමේ විපාක දැනටමත් අප අත් විඳිමින් ඉන්නවා. වැඩිවන ගෝලීය උණුසුම ඉන් එකක්. මෑත දී උද්ගත වුනු මූල්‍ය අවපාතයත් ඊට උදාහරණයක් බව කිව යුතුයි. ඇමෙරිකානු පාලකයන් ඇතුළු ලොව සුපිරි බලවතුන් ගේ නායකත්වයෙන් අරාබි රටවල් මත මුදාහල යුද්ධය නිසා විය යුතු පරිද්දෙන්ම ඒ සුපිරි ලෝක ක්‍රමයට එරෙහිව අභියෝග කළ හැකි ජාත්‍යන්තර කැරලිකාර ව්‍යාපාරයක්ද බිහිවුණා. ගෝලීය ක්‍රමයක් තුළ දේවල් සිද්ධවන්නේ ගෝලීය පරිමාවෙන්මයි. ඔසාමා බින් ලේඩන් මහතා ගෝලීය කැරලි කරුවෙක් වුණේ ඒ යථාර්ථය තුළයි. ඔහුගේ එක් තර්ජනයකින් ගෝලීය ජාලයම සසල වෙනවා. ඔහු සයිබර් සත්ත්වයෙක් නිසා. ඒ නිසාම සුපිරි ලෝක සමාජය තුළ ප්‍රාග්ධනයටත් තර්ජන එල්ල වුණා. ඒ ප්‍රාග්ධනය ආරක්ෂිත ක්ෂේමභූමි කරා සුපිරි වලල්ලෙන් පිටට ගියා. රැකවරණය දෙන්න සුපිරි බලවතුන්ට බැරිවුණා. අවසානයේ ක්‍රමයෙන් ඇමෙරිකානු මූල්‍ය වෙළඳපොල පිරිහුණා. අවසානයේ සමස්ථ ක්‍රමයම බිඳවැටුණා. ක්‍රියාවලියේ ආරම්භය ඇමෙරිකානු සුපිරි යුද්ධ තීරණය නිසා සිදුවුණත් අවසානය සිදුවුණේ ඒ සුපිරි ක්‍රමයේම පමණක් නොව ඊට නියමින් අනියමින් සම්බන්ධ වී සිටින ජාලයම අර්බුදයට ගොදුරුවීමෙන්. ඇතැම් විචාරකයන් ඇමෙරිකාවේ අර්බුදය සමාජවාදී සැලසුම් සහගත ක්‍රමයක් ගෙනයන චීනය රුසියාව වැනි රටවල් කෙරෙහි බලපෑමක් ඇති නොකරනවායැයි කියල කීවත් සති දෙක තුනක් යන විට ඔක්කොම අර්බුදයට ගොදුරුවුණා. ගෝලීය සමාජයක හෙවත් විශ්ව සමාජයක දේවල් සිද්ධ වන්නේ ඒ අන්දමටයි.ඒ නිසා විශ්ව සමාජයක එක් ජාතියක් සමූල ඝාතනය කොට සෙසු අයට පැවැත්මක් ඇත්තේ නැහැ. මන්ද ගෝලීය සමාජය වූ කලී සැම දෙනාම [illegible] අතර [illegible] රණය [illegible] මාන

pdfMachine
Is a pdf writer that produces quality PDF files with ease!
Produce quality PDF files in seconds and preserve the integrity of your original documents. Compatible across nearly all Windows platforms, if you can print from a windows application you can use pdfMachine.
Get yours now!

ජාත්‍යන්තර මූල්‍ය අවපාතය ගෝලීය සමාජයත් පූර්ව ගෝලීය සමාජයත් අතර ඇති දේශපාලන ප්‍රතිවිරෝධය පෙන්වන අවස්ථාවක් ලෙසයි මා හඳුන්වන්නේ. යුද්ධය හා අවිබලය ගැටුම් නිරාකරණයට සුදුසු මෙවලමක් නොවන බව මැදපෙරදිග යුද්ධය මගින් ඉගෙන ගන්නට පුළුවන්. මා කියන්නේ යන්තමින් ගොඩනැගෙමින් තිබෙන ගෝලීය සමාජය පවා පූර්ව ගෝලීය උපායයන් ප්‍රතික්ෂේප කරනවා කියන එකයි. ඇමෙරිකාවටත් ලංකාවටත් මේ මූලධර්මය පොදුයි.

විශ්ව සමාජයක් යනු මාක්ස්වාදීන්ට අරුමයක් නොවෙයි. කාල් මාක්ස් චින්තකයා සිය ආදර්ශ සමාජ ප්‍රවාදය ගොඩනැගුවේ ජාත්‍යන්තරවාදී හෙවත් විශ්ව සමාජ පංතියත් හා ක්‍රමයක් ගැන කල්පනා කරමින්. විප්ලවය වශයෙන් ඔහු විශ්වාස කළේ ජාත්‍යන්කර විප්ලවයක් මිස එක් දූපතක එක් මහාද්වීපයක සමාජ විපර්යාසයක් නොවේ. එය ස්වයං පෝෂිත දර්ශණය මත පදනම් වූ රොබින්සන් කෘෘසෝ වාදයක් නොවේ. පංති අතර ඇති විශමතාවය හා අසමාන රඳා පැවැත්ම අහෝසිකිරීම තුළින් අනන්තය දක්වා සමාජ සංතෘෂ්ඨිය ඉපැදවීම ඔහුගේ අරමුණවිය. පංතීන් අතර අසමාන රඳාපැවැත්ම හෙවත් සූරාකෑම ලෙස හැඳින්වෙන ක්‍රියාවලිය අහෝසි කිරීම සමාජ විප්ලවයක් මිස අන් සතු දේ පැහැරගැනීමේ යුද්ධයක් නො වන බව ඔබ දන්නා බව මා සිතනවා. මේ අර්ථයෙන් අපංතික විශ්ව සමාජයක් වෙනුවෙන් පෙනී සිටින්නන් යුද්ධවලට පක්ෂ වන්නේ නැත. යුද්ධ යනු මේ නවීන යුගයේ දී යල් පැනගිය පූර්ව ශිෂටාචාර යුගයට අයත් භාවිතාවක්. එය දරන්නේ පසුගාමී මිනිසුන්, ගෝලීය ශිෂ්ටාචාරයට එරෙහි ගොඩයන් බව කිවයුතුයි. අතීත ලෝකයේ මිනිසා ප්‍රතිශතයක්  වශයෙන් සිය පරම ආයුෂ කාලයෙන් විශාල කොටසක් ආහාර සෙවීමටත් යුද්ධ කිරීමටත් වැය කළා. ජීවිතයේ සතුට වෙනුවෙන් දශම ගානක් වත් වෙන් කර ගත්තේ අමාරුවෙන්. ඒකත් ඇති හැකි අය අතර පමණයි. නමුත් විශ්ව සමාජයේ මිනිසා ආහාර සෙවීම ආරක්ෂාව සහ තවත් අති මූලික අවශ්‍යතා වෙනුවෙන් වැය කරන්නේ දශම ගණනක්. විශාල කොටසක් විනෝදය අලුත් දේ සොයා ගැනීම සතුට ආදිය වෙනුවෙන් වැය කරනවා. යුද්ධය ගල් වැද්දන්ගේ ක්‍රීඩාවක් වශයෙන් සලකනවා. ඇතැම්විට යුද්ධයකට ඉඩක් විවරවනුයේ ළමුන් වෙනුවෙන් සයිබර් අවකාශය තුළ පමණක් වියහැකියි.

වාර්ගික ගැටුම සිවිල් යුද්ධයකට මාරු වූයේ 1983 දී යැයි සැලකුවහොත් මේ වනවිට වාර්ගික යුද්ධයට විසිපස් වසරක් වයසය. ඒ යුද්ධය නිසා නියමින් ද අනියමින් ද මිය පරලෙවෙ ගිය පුද්ගලයන් සංඛ්‍යාව ලක්ෂය ඉක්මවා ගොස් තිබේ. ඉන් වැඩි දෙනා සිවිල් පුරවැසියන්. වැය කර ඇති ධනස්කන්දය ගණන් බැලුවවිට පෙනී යන්නේ මේ රට තරම් භූමියක් මිල දී ගන්න වුවද එය ප්‍රමානවත් බවයි. මේ වසර විසිපහ තුළ ඒ වෙනුවෙන් සෘජුවම නැතිවූ මිනිස් ශ්‍රම පැය ගණන්වල වටිනාකමත් ලෝක සමාජය තුළ අපට අහිමිවූ අවකාශයේ වටිනාකමත් මේ ගණන්වලට එකතු කළහොත් තත්ත්වය සිතාගන්නවත් බැහැ. නමුත් යුද්ධය තව තවත් පුලුල් වෙමින් ද ගැඹුරු වෙමින් ද කවුරුත් නොදන්නා අනාගතයේ ඈත ඉලක්කයක් සොයා ගමන් කරන බව පැහැදිලියි. රණවාදීන්ගේ බලාපොරොත්තු හා අනුමාන බිඳ වැටෙමින් යුද්ධයේ මායිම් පුලුල් වෙමින් තිබෙනවා.

පවතින සැබෑ තත්ත්වය නම් ශ්‍රී ලංකාවේ පාර්ශවයන් අතින් එහි පාලනය ගිලිහෙමින් තිබීමයි. වෙනත් වචනවලින් කියනවානම් වාර්ගික ගැටුමේ කේන්ද්‍රය ලංකාවෙන් පිටතට ගමන් කරමින් තිබෙනවා. එය සිදුවන්නේ භූගෝලීය සිතියම් අනුව නොව මානව සිතියම් වල මූලධර්මවලට අනුවය. මානව සිතියම් ගැන අවබෝධයක් නොමැතිව මෙ වැනි අර්බුදවල ව්‍යාප්තිය හෝ කෙළවර තේරුම් ගැනීම කළ නොහැකියි. මානව අර්බුද දරුණු අවි ගැටුම් හා කුරිරු මිනිස් ඝාතන බවට පත්විය හැකිය. එහෙත් ඒවා හුදු සිවිල් කැරලි කෝලාහල ගනයේ ලා අවි බලයෙන් කළමණාකළ නොහැකියි. එසේ කිරීමට යාමෙන් සිදුවන්නේ අර්බුදය පාලනය කළ නොහැකි තත්ත්වයකට පත් වීමයි. ශ්‍රී ලංකාවේ වාර්ගික ගැටුමෙහි වර්තමාන තත්ත්වයද එයයි. අවසාන වශයෙන් එක් දෙයක් කිවයුතුයි. ලංකාවේ රණ බිම තුළ රසායණික සමූල ඝාතක අවි භාවිතා වනවාය යන්න ලෝකයට රහසක් වී තිබුණායැයි සිතිය යුතු නැහැ. යුධ අවි සමාජයේ ලෝක බලවතුන් ට හොරෙන් ඒවා කරන්නට බැහැ. එහෙත් ඒ අය මේ අවිවල තත්ත්වය ගැන පරීක්ෂා කරන්නට ලංකා රණබිම දෙස සෝදිසියෙන් සිටි බවත් ලංකාව පරීක්ෂණාගාරයක් හැටියට යොදාගෙන ඇතිබවත් ඔබ තේරුම් ගතයුතුයි. ශ්‍රී ලාංකිකයන් තමන්ගේ වියදම් ද දරමින් තමන්ගේ රටවැසියන්ගේ ජීවිත අනුන්ගේ පර්යේෂණ සඳහා ලබාදීම කණගාටුවකට කරුණක්. සාමාන්‍ය ජනයාට මේ ගැන හෙළිදරව්වී විරෝධයක් මතුවීමෙන් පසු පමණක් ලෝකය එනම් යුධ අවි සමාජයේ උදවිය මීට විරුද්ධවන්නේ ලෝක සම්මුතීන්ට තමනුත් ගරුකරන බව පෙන්වීමට බව මගේ හැඟීමයි.

**pdfMachine**
**Is a pdf writer that produces quality PDF files with ease!**
Produce quality PDF files in seconds and preserve the integrity of your original documents. Compatible across nearly all Windows platforms, if you can print from a windows application you can use pdfMachine.
Get yours now!